# හද රිදවන මතක සුවඳ



## අවසන් කොටස

**රෝහිත මුණසිංහ**
ප්‍රංශයේ සිට

*රෝහිත මුණසිංහ ලියූ "හද රිදවන මතක සුවඳ" ශ්‍රී ලාංකික දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී භූමිකාවකට පණ පෙවූ ජනතා විමුක්ති පෙරමුණේ දෙවන කැරැල්ල පිළිබඳ ලියැවුණ අව්‍යාජ ලියවිල්ලකි. තමා අනුගත දේශපාලන මතිමතාන්තර හමුවේ අන්ධව සිටින බොහෝ මිනිසුන් අතර රෝහිත සුවිශේෂී වන්නේ තමාද සහභාගි වූ කැරැල්ලක් පිළිබඳ ස්වයං විවේචනයක් කරන්නට තරම් ශක්තියක් ඔහුට තිබුණ නිසාවෙනි. මෙම ලිපි පෙළ ගැඹුරින් කියවා අපට අදහස් දක්වූ අයට සේම පළවූ සේයාරූ දෙස පමණක් බලා අදහස් දක් වූ අයටත් ස්තුතියි.*

ඉතාලි ධර්මේ හෙවත් ධර්මේ සහෝදරයා ගැන ලියන මෙම සටහන ආරම්භයේදීම සෝමවංශ අමරසිංහ සහෝදරයා විසින් පෝල් පීරිස් සහෝදරයාට ඉදිරිපත් කරන ලද එක් චෝදනාවක් සටහන් කිරීම මැනවයි සිතේ.

19 වැනි චෝදනාව

අන් අය පක්ෂයට කෙළින් ඉදිරිපත් නොකරන දේ පක්ෂයට හා මට දැන්වීමේ කොන්ත්‍රාත්තුව භාර ගැනීම. (වරක් රෝමයේ ධර්මසේන පක්ෂයෙන් ඉවත් වෙන්නට යනවා යය් මා දැනුවත් කිරීමට භාරගෙන තිබුණේ ඔබය. ධර්මසේනට එය මට ලියා එවන ලෙස ඔබ එවිට කියා නැත.)

පොදු සමාජයේ විවිධාකාර හැකියාවන්ගෙන් සහ දක්ෂතාවන්ගෙන් යුතු පුද්ගලයන් සිටින්නාක් සේ පක්ෂයේද විවිධ හැකියාවන්ගෙන් හා නිපුණතාවලින් යුතු පාක්ෂිකයෝ සිටිති. පක්ෂය, පක්ෂයේ උන්නතිය සඳහා ලබාගත්තේ එක් එක් පුද්ගලයා සතුව තිබූ එවන් විශේෂ හැකියාවන් වේ. ජ.වි.පෙ. අනුගමනය කරන ලද මාක්ස්, ලෙනින්වාදී දේශපාලනයේ න්‍යායික පැත්ත ගැන අවබෝධයක් නොතිබුණද පක්ෂයට හදවතින්ම ආදරය කළ, පක්ෂය වෙනුවෙන් ඕනෑම පරිත්‍යාගයක් කරන්නට සූදානම් වු ඕනෑම අවදානමක් දරන්නට ඉදිරිපත් වු සහෝදරවරු සිටියහ. ඉතාලි ධර්මේ සහෝදරයා ද එවැන්නෙකි.
සාමාන්‍ය කෙනෙකුට ඉතාලියේදී කරගත නොහැකි යම් කාර්යයක් ගැන සඳහන් කරන විටදී පක්ෂයේ නායක සහෝදරවරුන් පවා, "හරි හරි ඒ වැඩේ ධර්මේ සහෝදරයට භාරදෙමු. ධර්මේ වැඩේ කරාවි" යනුවෙන් පැවසුවේ ආඩම්බරයෙනි. එසේම විශ්වාසයෙනි.

පක්ෂය වෙනුවෙන් උදව් " උපකාර කළයුතු කෙනෙක් වෙත්නම් ඔහුගේ උස, මහත, දිග, පළල මැන බැලුවේ ධර්මේ සහෝදරයා නොවේ. ඔහු කළයුතු දේ කළේ ය.

ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ මිනීමරු හමුදාවලින් ජීවිත බේරා ගන්නට විදේශයන්ට පලාගිය සහෝදරවරුන් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් යුරෝපා රටවලට ඇතුළුවීමට එද්දී දේශසීමා පන්නවා එම පිරිස් අවශ්‍ය රටවල්වලට ඇතුළු කිරීමට ධර්මේ මැදිහත් වු වාර අපමණය.

නීතියට එකඟ නොවු විවිධ ව්‍යාපාර සම්බන්ධයෙන් ඉතාලි පොලිසියේ උකුසු ඇසට ලක්ව සිටියදීත්, තමාට ඇති අවදානම මායිම් නොකළ ධර්මේ එක් විශේෂිත පුද්ගලයෙකු ඉතාලියේ සිට ප්‍රංශයට ගෙන ඒමේ වගකීම භාර ගත්තේ ය. එසේම එම වගකීම ධර්මේට භාරදීමට තරම් එම පක්ෂයට ඔහු විශ්වාසවන්ත පුද්ගලයෙකු වුයේ ය. එම විශේෂිත පුද්ගලයා සෝමවංශ අමරසිංහ සහෝදරයා ය. ධර්මෙ සහෝදරයා අනුගමනය කරන්නා වු එක්තරා ක්‍රමවේදයකට අමරසිංහ සහෝදරයා නිරුපද්‍රිතව පැරිසියට ගෙනඒමට ධර්මේ සමත් විය.

ධර්මෙ සහෝදරයාගේ ජීවිතයේ ලොකු වෙනසක් සිදුවන්නේ ඔහු ඉතාලි පොලිසියේ අත්අඩංගුවට පත් වී සිරගතවීමත් සමඟ ය. තරමක කාලයක් ගතව ගියේ ය. පෙරදී ධර්මෙ ගැන බොහෝ ආඩම්බරයෙන් කථාකළ පක්ෂය ඉන් පසුව කථා කරන්නට වුයේ සදාචාරසම්පන්න හැසිරීම හා විනය, ආත්ම ගරුත්වය ආදී ප්‍රශ්න ගැනය. දැන් ධර්මේ පක්ෂයට අවමානයකි. මන්ද ඔහු නීති විරෝධී ජාවාරමකට අසු වී හිරගත වුවෙකු බැවිනි.

හිරෙන් නිදහස් වී මද කලකින් ඉතාලිය හැරදැමු ධර්මේ සහෝදරයා ප්‍රංශයේ පදිංචියට අවේ ය. ප්‍රංශයට පැමිණි මුල් සතියේම ධර්මේ සහෝදරයා මා හමුවිය. මේ ඔහු එදා මට කියු වචනම ය. මට කට උත්තර නැතිවෙන්නට මගෙන් විමසු ප්‍රශ්න ය.

"සහෝදරයා, මම කරපු ඔය බිස්නස් එකයි, අනිත් ජල්බරි වැඩයි පක්ෂය දැනගෙන හිටියා. ඒවා වැරදි වැඩනම් ඇයි එදා මට අවවාද කරලා මාව නිවැරදි කරගත්තෙ නැත්තේ ? මම හොඳ මඟට ගත්තෙ නැත්තේ ඇයි ? මම අහවල් අහවල් අයවත්, පක්ෂයේ සහෝදරුන්වත් බෝඩර් පන්නලා ඉතාලියට ගේන කොටත්, ප්‍රංශයට ගේන කොටත් ඒවා වැරදි වැඩ කියලා දැනගෙන හිටියේ නැද්ද ? මම අර බිස්නස් එකෙන් හොයපු සල්ලි දහස් ගණන් පක්ෂයට දෙනකොට, ඉතාලියට ආපු පක්ෂයෙ ලොක්කන්ගෙයි, පොඩ්ඩන්ගෙයි වැඩවලට වියදම් කරන කොට ඒ වැරදි සල්ලි හොඳ උනේ කොහොමද ? මම නරක මිනිහෙක් කියලා හංවඩු ගහලා අයින් කරාට මට දුක නෑ. මට දුක පක්ෂයේ සමහරු කියනවලු " අපෝ ඕකා ...... කාරයා නේ කියලා."

තමාගේ දැනීමේ හා තමාගේ හැකියාවේ පරිමාණයට පක්ෂයට උදව් උපකාර කළ ධර්ම සහෝදරයාගේ සේවය අගයනු වස් ජ.වි.පෙ. ජාත්‍යන්තර ප්‍රකාශය වු අරුණෝදයෙහි මෙවැනි උපහාර වාක්‍ය ඛණ්ඩයක් පළවිය.

"පක්ෂයේ නම විකුණාගෙන පක්ෂය විනාශ කරන කඳ පණුවකු බවට පත් වු...."

ඉරිදා සිංහල පුවත්පත් මිලදී ගන්නට පැරිසියේ "ලා ෂපෙල් හි" සිරස වෙළෙඳ සලට (සිංහල කඩේට) ගිය විට ඇතැම් දිනක මට ධර්මෙ සහෝදරයා හමුවුයේ එහිදීය. එවිටද ඔහු කථා කළේ දිනෙන් දින ප්‍රගතිය කරා යන පක්ෂයේ ගමන ගැන සොම්නස්ව ය.

බිරිඳත්, දරුවනුත් සමඟ ප්‍රංශයේ වාසයට පැමිණි පසු ඇතැම් විටෙක ධර්මෙ සහෝදරයා හිටියේ ස්ථිර රැකියාවක් නොමැතිව ය. මේ කැමිලෝ සහෝදරයා මා සමඟ පැවසු කථාවකි.

"එක දවසක් ධර්මෙයි මමයි ලා ෂපෙල් වල ඇවිදගෙන යනකොට සිංහල කඩේ කිට්ටුව පක්ෂයේ අය මැතිවරණ අරමුදලට ආධාර එකතු කරනවා. ධර්මෙ මට කිව්වා, සහෝදරයා මට පක්ෂයට ආධාරයක් කරන්න ඕන. මම දුන්නොත් සල්ලි ගනියිද දන්නේ නෑ. ඔයා මේ සල්ලි දෙන්න කියලා. එතකොට මම කිව්වා, ආධාර එකතු කරන කොට සල්ලි දෙන්නෙ කව්ද කියලා ප්‍රශ්නයක් නැහැනේ ඔයාම දෙන්න කියලා. ඒ පාර ධර්මේ ප්‍රෑන්ක් 500 ක් දුන්නා. ඒ දවස්වලත් මිනිහට හරියට රස්සාවක් නෑ. ධර්මෙ පක්ෂයට ආදරේ කළේ අන්න එහෙමයි."

හෘදයාබාධයක් වැලඳුණ ධර්මෙ සහෝදරයා සිය ජීවිතයෙන් සමුගත්තේ උන්හිටි ගමන් ය. කුලතුංග සහෝදරයාගේ අවමඟුලට නොපැමිණි, විමලෙ සහෝදරයාගේ අවසන් කටයුතු වලට නොපැමිණි ජ.වි.පෙ. පැරිස් ශාඛාවේ කිසිවෙක් ධර්මේට අවසන් ගෞරව දැක්වීමට ද නොපැමිණියහ.

එය එසේ මුත් සිහළ උරුමයේ පැරිස් සංවිධායකවරයාව සිටි කේ. පී. කරුණානායක මහතාගේ අවමඟුල් උත්සවයට ජ.වි.පෙ. පැරිස් සංවිධායක ප්‍රමුඛ කමිටු සාමාජිකයෝ සහභාගී වුහ. (වර්ෂ 2005 මුල කාර්තුවේදී මෙම අභාවය සිදුවන විට "ජ.වි.පෙ. හා හෙළ උරුමය" මහින්ද රාජපක්ෂ මහතා දිනවීමට එක පෙරමුණක ක්‍රියාත්මක නොවු බව සිහිපත් කළ මනාය.

යහපත් ප්‍රවණතාවකි. සතුටට හේතුවිය යුතු මංගල කරුණකි. මන්ද අපේ සහෝදරවරුන් දැන් ඒ තරම්ම දියුණු වී තිබේ.

සෝමවංශ අමරසිංහ සහෝදරයා සහ ලන්ඩන් ශාඛාව අතර ඇති වු අර්බුදය මෝරායද්දී පැරිසියේ පක්ෂ ශාඛාව ලෙස පැවතියේ තාවකාලික කමිටුවකි. මෙම කමිටුවෙහි සිටි පක්ෂයේ පැරණිම සාමාජිකයා මම වීමි. තවත් සහෝදරවරුන් දෙදෙනෙකු ලංකාවේදී පක්ෂයේ යාවජීව සාමාජිකයන් ලෙස වැඩකර පළපුරුදුකම් ලබාසිටි අතර ඉතිරි පස් දෙනා හෝ හයදෙනා පැරසියේදී පක්ෂයට සම්බන්ධ වුවෝ වුහ. ඒ අතුරින් ස්වෝත්සාහයෙන් පොතපත කියවා දේශපාලන දැනුමක් ලබාගෙන පක්ෂයට සම්බන්ධ වුවෙකු වුයේ කැමිලෝ සහෝදරයාය. (ලන්ඩන් ශාඛාවේ පෝල් පීරිස් සහෝදරයා අමරසිංහ සහෝදරයාට දුන් පිළිතුරක කැමිලෝ සහෝදරයා ගැන සඳහන් වෙයි.) එවිට පැරිස් සංවිධායක වුයේ මෙහි අන් තැනක "විප්ලවවාදී පොලිස්කාරයා" යයි මවිසින් හඳුන්වන ලද ශිරෝමන් ය.

මෙම කාලය වනවිට අමරසිංහ සහෝදරයා කමිටු සාමාජිකයන් මුණ ගැසීමෙන් වැළකී සිටින බවක් පෙනිණ. එබැවින් ලන්ඩන් ශාඛා අර්බුදය ගැන කථා කිරීමට මට තිබු බලවත් උවමනාව මුදා හැරීමට සිදුවුයේ කමිටු රැස්වීමේ දී ශිරෝමන්ගෙන් ප්‍රශ්න කිරීමෙනි. මා මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ සෑම වරෙකම ඔහු උත්සාහ කළේ එය නොවැදගත් ප්‍රශ්නයක් සේ හැගෙන ආකාරයට ප්‍රශ්නයෙන් මඟ හැරීමට ය.

පක්ෂයට හිතවතෙකු සාමාජිකයෙකු ගොඩනගා ගැනීමට විඳිය යුතු වෙහෙස හා දුක මම මැනවින් අත්විඳ සිටියෙමි. එය දසමසක් සිය ගැබ්බර උසුලාගෙන අවසානයේ වධ වේදනා විඳ දරුවෙකු මෙලොවට බිහිකරන මවකගේ පාරමිතාවට සමකිරීම වරදක් නැතැයි මට සිතේ. ද්‍රෝහිකම් කිරීමේ චේතනාවෙන්ම පක්ෂයට රිංගවන ඔත්තුකරුවන් හෝ සිතාමතා ද්‍රෝහිකම් කරන්නන් ද්‍රෝහීන් ලෙස සලකා නෙරපා හැරීම කිසිදු ප්‍රශ්නයක් නොවේ. එහෙත් මගේ ඒකාන්ත විශ්වාසය වුයේ ලන්ඩන් සොයුරන් එවැන්නන් නොවන බවය. එබැවින් මගේ ඒකායන පරමාර්ථය වුයේ මෙම ප්‍රශ්නය දුරදිග ගොස් වටිනා සහෝදරවරුන් කිහිප දෙනෙකු පක්ෂයට නැතිවීමට පෙර අර්බුදය සමථයකට පත්වනු දැකීමය. කැමිලෝ සහෝදරයා ද මගේ ස්ථාවරයේම සිටින බව පෙනීගියේ ඔහු ද මා මෙන්ම ලන්ඩන් ප්‍රශ්නය ගැන මැදිහත් වීමෙනි. මේ ප්‍රශ්නය මතු වු සැමවිටම ශිරෝමන් පිළිතුරු දුන්නේ ඔහුගේ පොලිස්කාර භාෂාවෙනි. මෙම විවාදය උණුසුම් අතට හැරුණු අවස්ථා ද විය. හඬ ශිරෝමන්ගේ වුවත් අදහස් අමරසිංහ සහෝදරයාගේ බ වමට පැහැදිලිවම වැටහිණි. මේ උණුසුම් වාද විවාදයන්හිදී මගේ අතින යම් වරදක් සිදු වු බව නොපැකිලවම හා නිහතමානීව පිළිගත යුතුය. එනම් ඩේවිඩ්සන් හිතාමතා නිර්මාණය කර මට කියු අසත්‍ය කථා (මා පසුව තේරුම්ගත් පරිදි) ගැන මේ කමිටුවේදී ප්‍රශ්න නැගීම ය.




හදිසි කරුණක් සඳහා BREGUET SABIN (බ්‍රෙගුවේ සබැං) නම් වු උමං දුම්රිය පොළේදී හමුවන්නැයි ශිරෝමන්ගෙන් මට දුරකථන ඇමතුමක් ලැබිණ. යොදාගත් වේලාවට අපි එහිදී හමුවීමු. තරමක පාළු ස්වභාවයක් උසුලන උමං දුම්රිය පොළ තුළ සිටියේ මගීන් කිහිප දෙනෙකි. අපි අසුන් දෙකකට බරවීමු. විනාඩියක දෙකක තරම් වු නිහැඬියාවක් පැවතිණ. එම නිහැඬියාව බිඳලමින් උමං දුම්රියක් පැමිණියේ ය. ශිරෝමන් තමා අතේ වු දිනපොතේ පිටු අතර තිබු යම් ලියවිල්ලක් අතට ගත්තේ ය.

"සහෝදරයා අද පටන් පක්ෂයෙන් නෙරපා දමා ඇතිබව දැනුම් දෙන්නයි කැඳෙව්වේ" ශිරෝමන් තෝල්ක මුදියාන්සේ කෙනෙකු මෙන් අමරසිංහ සහෝදරයාගේ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කළේ ය.

"මම පුදුම වෙන්නෙ නෑ. ඒ උනාට මොකක්ද හේතුව ?"
"සහෝදරයා පක්ෂය දරන මතයට පටහැනි මතයක් දැරීම"

"ඒක විහිළුවක්, මම තවම පිරිසිදු මාක්ස් " ලෙනින් වාදියෙක්. නිර්ධන පංති ජාත්‍යන්තර වාදියෙක්. විද්‍යාත්මක සමාජවාදය විශ්වාස කරන භෞතිකවාදියෙක්. ඒකනෙ පක්ෂය දරන මතය ? මම හිතන්නේ අප්‍රකාශිත හේතුව තමයි එහෙයියෙකු නොවීම"

"සහෝදරයා පක්ෂයට කරපු වැරදි වැඩ කිහිපයක සාක්ෂි අපි ළඟ තියෙනවා"

31 වන පිටට